සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.11.30 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2023 නොවැම්බර් මාසයේ දී ඉහළ ගියේය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 ඔක්තෝබර් මාසයේ වාර්තා වූ සියයට 1.5හි සිට 2023 නොවැම්බර් මාසයේ දී සියයට 3.4 දක්වා ඉහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම ඉහළ යෑම, 2023 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන ලද පුරෝකථනයන්ට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 ඔක්තෝබර් | 2023 නොවැම්බර් |
|---|---|---|
| දර්ශක අගය | 191.4 | 193.4 |
| මාසික වෙනස (%) | -0.2 | 1.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 1.5 | 3.4 |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.

අඛණ්ඩව පස්වන වරටත් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර අවධමනයක් වාර්තා වූ අතර, එය 2023 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 5.2ට සාපේක්ෂව 2023 නොවැම්බර් මාසයේ දී සියයට 3.6ක් විය. මේ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර නොවන උද්ධමනය 2023 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 4.9හි සිට 2023 නොවැම්බර් මාසයේ දී සියයට 6.8 දක්වා ඉහළ ගියේය. 2023 නොවැම්බර් මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස, සියයට 1.06ක් ලෙස වාර්තා විය. මේ සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් පිළිවෙලින් සියයට 0.12කින් සහ සියයට 0.95කින් ඉහළ යෑම හේතු විය. නවද, ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 1.2හි සිට 2023 නොවැම්බර් මාසයේ දී සියයට 0.8 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සහ සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව උද්ධමනය මැදි කාලීනව සියයට 5ක ඉලක්කගත මට්ටමෙහි ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, අපේක්ෂිත බදු වැඩිවීම් සහ ඒවායේ වක්‍ර බලපෑම්, සහ පරිපාලනමය වශයෙන් තීරණය වන මිල ගණන්වල ඇති විය හැකි ඉහළ යාම් සමඟ, උද්ධමනය තාවකාලිකව ඉහළ යෑමක් කෙටි කාලීනව සිදුවිය හැකිය.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන[(අ)]**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,[(ආ)] කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්වම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ වේ. විවිධ සාධක පුරෝකථන සඳහා දැනටමත් සෘජුව හෝ වක්‍රව සලකා ඇති අතර එම සාධක එම මට්ටම් වලින් අපගමනය වීමේ හැකියාව හේතුවෙන් මෙම අවිනිශ්චිතතා හට ගනී. විශේෂයෙන්, බදු වැඩි වීමේ හැකියාව සහ එමගින් ඇති විය හැකි වක්‍ර බලපෑම්, වැටුප් වැඩි වීම් සිදු වීමට ඇති හැකියාව, බලශක්ති මිල ගණන් වල ඇති විය හැකි විශාල වැඩි වීම්, ආනයන සීමා ලිහිල් කිරීම මධ්‍යයේ අපේක්ෂිත මට්ටම් වලට වඩා වැඩියෙන් විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමට ඇති හැකියාව, ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම හා එමගින් ආහාර උද්ධමනයේ ඇති විය හැකි ඉහළ යෑම වැනි සාධක මගින් උද්ධමන පුරෝකථන ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, පුරෝකථන සඳහා පහළ යෑමේ අවදානම් සැලකුවිට, සැපයුම් තත්ත්ව වේගයෙන් යථා තත්ත්වයට පත්වීමට ඇති හැකියාව සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ තිරසාර බලපෑම ඇතුළත් වේ.

***මූලය***: *ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2023 වසරේ නොවැම්බර් මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |
| | ජූනි | 192.3 | 169.9 | 0.0 | -0.6 | 12.0 | 9.8 |
| | ජූලි | 190.2 | 170.4 | -1.1 | 0.3 | 6.3 | 5.9 |
| | අගෝස්තු | 190.1 | 171.2 | -0.1 | 0.5 | 4.0 | 4.6 |
| | සැප්තැම්බර් | 191.8 | 172.0 | 0.9 | 0.5 | 1.3 | 1.9 |
| | ඔක්තෝබර් | 191.4 | 172.4 | -0.2 | 0.2 | 1.5 | 1.2 |
| | නොවැම්බර් | 193.4 | 172.4 | 1.0 | 0.0 | 3.4 | 0.8 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව